# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

2 ශ්‍රේණිය -බුද්ධ ධර්මය - නොවැම්බර් මාසය - 1 වන සතිය

සැකසුම :- බලංගොඩ අධ්‍යාපන කලාපය.

M.A.R.P.කුමාරි - ර/රත්මලවත්ත මහා විද්‍යාලය

## <u>කම්මැලි නැති ළමයි - 19 වන පාඩම</u>

ආයුබෝවන් දුවේ පුතේ ඉතිං කොහොමද ඔයාලට. ඔන්න මම පුතාලට කවියක් කියන්නම්. හොදට අහගන්න.

" ඉර උදා වන්නට පළමුව නැගිට සිහිකොට

අලසකම් දුරු කොට කරන් වැඩපළ දියුණු වන්නට."

මොකක්ද මේ කවියෙන් කියන්නෙ බලන්න. ඉර පායන්නට කලින් නැගිටලා කම්මැලි නැතුව තමන්ගේ වැඩ කටයුතු කරන්න කියලා. එහෙනම් දුවලා පුතාල හිතට ගන්න. අද පටන් කම්මැලි කම ඔයාල ගාවින් අයින් කර ගන්නවා කියලා.

දුවලා පුතාලා කියන්න බලන්න උදෙන්ම අවදි වෙලා අපට කල හැකි දේවල් මොනවද කියලා.

1. එහෙනම් ඔයාල පහත වාක්‍ය තෝරලා යා කරන්න.

| | | |
|---|---|---|
| කම්මැලි නැති ළමයා | උදෙන්ම අවදි වීම. | කම්මැලි ළමයා |
| | පාඩම් වැඩ අතපසු කිරීම. | |
| | පමා වී පාසලට යෑම. | |
| | මූණ අතපය සේදීම. | |
| | දත් මැදීම. | |
| | වෙලාවට වැඩ කිරීම. | |
| | ඉර පායන තෙක් නිදා ගැනීම. | |
| | මල් වලට වතුර දැමීම. | |

එහෙනම් පුතාලා මේ කවිය පාඩම් කර ගන්න. කම්මැලි උනොත් පාඩම් කරගන්න බැරි වෙයි. උදේ පාන්දරින් නැගිටලා දත් මැද මුව සෝදලා අපේ වැඩ අපිම කර ගනිමු.

මෙම පාඩමට අයත් වීඩියෝව නැරඹීම සදහා youtube එකට ගොස් Renuka kumari කම්මැලි නැති ළමයි ලෙස type කරන්න.

**"හොදයි ආදරණිය දුවේ, පුතේ ඔයාලට තෙරුවන් සරණයි!"**